// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2019/5 - 2017 මැයි මස 15 වැනි සඳුදා - 2017.05.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### 2016 අංක 01 දරන උතුරු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය ප්‍රඥප්තිය

2016 අංක 01 දරන උතුරු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය ප්‍රඥප්තියේ 62 වන වගන්තිය යටතේ උතුරු පළාත් ධීවර, ප්‍රවාහන, වෙළඳ හා වාණිජ, ග්‍රාමීය සංවර්ධන, මාර්ග සංවර්ධන හා මෝටර් රථ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

බී. දෙනිස්වරන්,
උතුරු පළාත් ධීවර, ප්‍රවාහන, වෙළඳ හා වාණිජ,
ග්‍රාමීය සංවර්ධන, මාර්ග සංවර්ධන හා
මෝටර් රථ ප්‍රවාහන අමාත්‍ය.

2017 මැයි මස 15 වැනි දින,
යාපනයේ දී ය.

නියෝග

1. මෙම නියෝග 2017 අංක 1 දරන උතුරු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

**I වන කොටස**

***මගී ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීම***

2. (මෙහි මින්මතු "බලපත්‍රය" යනුවෙන් සඳහන් කරනු ලබන) මගී ප්‍රවාහන සේවා බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් 2016 අංක 1 දරන උතුරු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය ප්‍රඥප්තියේ III වන කොටසේ (මගී ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීම) විධිවිධාන අදාළ විය යුතු ය.

3. බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කිරීමට අපේක්ෂා කරනු ලබන සෑම තැනැත්තකුම (මෙහි මින්මතු "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය වෙත මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගාස්තුව සමග I වන උපලේඛනයේ "අ" ආකෘතිය අනුව වූ ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතු ය.

4. 3 වන නියෝගය යටතේ වන සෑම ඉල්ලුම්කරුවකු විසින් 2016 අංක 1 දරන උතුරු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය ප්‍රඥප්තියේ 13 වන වගන්තියේ නිශ්චිතව සඳහන් නියමයන්ට අමතරව පහත සඳහන් ලේඛන ඒවායේ සහතික පිටපත් සමග ඉදිරිපත් කළ යුතු ය -

(අ) ඉල්ලුම්පත්‍රයට අදාළ බස්රථය සම්බන්ධයෙන් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද ලියාපදිංචි සහතිකය ;

(ආ) 2016 අංක 1 දරන උතුරු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය ප්‍රඥප්තියේ 15 වන වගන්තියේ නියමයන් ප්‍රකාරව අනුමත ආයතනයක් විසින් ඉල්ලුම්පත්‍රයට අදාළ බස් රථය සම්බන්ධයෙන් නිකුත් කරන ලද යෝග්‍යතා සහතිකය ;

(ඇ) තෙවන පාර්ශ්වයේ අවදානම්වලට එරෙහිව ඉල්ලුම්කරුගේ නමින් වලංගු සීමාරහිත රක්ෂණයක් සහ එම බස්රථයේ මගීන් සඳහා රක්ෂණ ආවරණයක් ;

(ඈ) එම බස් රථය සඳහා වලංගු ආදායම් බලපත්‍රයක් ;

(ඉ) යම් පුද්ගලයකු සම්බන්ධයෙන් නම් ජාතික හැඳුනුම්පත හෝ සමාගමක් සම්බන්ධයෙන් නම් සංස්ථාගත කිරීමේ සහතිකය ;

(ඊ) එම බස්රථයේ සේවයේ යෙදවීමට අපේක්ෂා කරනු ලබන රියදුරුගේ වෛද්‍ය සහතිකය ;

(උ) එම රියදුරුගේ රියදුරු බලපත්‍රය ; සහ

(ඌ) උතුරු පළාත හැර වෙනත් යම් පළාතක ප්‍රවාහන සේවාවල එම බස් රථය නිරත වන්නේ නම්, අදාළ පළාතේ නිසි බලධරයා විසින් නිකුත් කරන ලද නිදහස් කිරීමේ ලිපිය,

5. ඉල්ලුම්පත්‍රයක් ලැබුණු විට, අධිකාරිය විසින් ඒ පිළිබඳව සෑහීමට පත්වීමෙන් පසුව 2016 අංක 1 දරන උතුරු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය ප්‍රඥප්තියේ 20 වන වගන්තියේ නියමයන් ප්‍රකාරව ඉල්ලුම්කරු වෙත බලපත්‍රයක් නිකුත් කළ යුතු ය.

6. සෑම බලපත්‍රයක් සහ වාමුවාවෙහි අලවනු ලබන ලේබලයක් පිළිවෙලින් මෙහි III වන උපලේඛනයේ සහ IV වන උපලේඛනයේ දක්වා ඇති ආකෘතිය අනුව විය යුතු ය.

7. (1) බලපත්‍රයක් අලුත් කරවා ගැනීම සඳහා වන සෑම ඉල්ලීමක්ම මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගාස්තුව සමග I වන උපලේඛනයේ දක්වා ඇති "ආ" ආකෘතිය අනුව ඉදිරිපත් කළ යුතු ය.

(2) (1) වන ඡේදය යටතේ වන ඉල්ලීම සමග 4 වන නියෝගයේ සඳහන් ලේඛනවලට අමතරව පහත සඳහන් ලේඛන ඉදිරිපත් කළ යුතු ය -

(අ) ඉල්ලුම්පත්‍රයට අදාළ බස්රථයේ බලපත්‍රය සහ එහි පිටපතක් ; සහ
(ආ) වාමුවාවෙහි අලවනු ලබන ලේබලය හා එහි පිටපතක්.

8. බස්රථය වෙනස් කිරීමකදී, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගාස්තුව සමග I වන උපලේඛනයේ දක්වා ඇති "ඇ" ආකෘතිය අනුව වූ ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතු ය. 7 වන නියෝගයේ (2) වන ඡේදයේ සඳහන් ලේඛන ඉල්ලුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතු ය.

9. මාර්ග බලපත්‍රයේ යම් නිවැරදි කිරීමක් කරනු ලබන අවස්ථාවකදී, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගාස්තුව සමග I වන උපලේඛනයේ දක්වා ඇති "ඇ" ආකෘතිය අනුව වූ ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතු ය. 7 වන නියෝගයේ (2) වන ඡේදයේ සඳහන් ලේඛන ඉල්ලුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතු ය.

## II වන කොටස

### *මගී ප්‍රවාහන සේවා බලපත්‍රයක නියමයන් හා කොන්දේසි*

10. පොදු නියමයන් හා කොන්දේසි පහත පරිදි විය යුතු ය.

(අ) සෑම බලපත්‍රයක්ම නිකුත් කරන ලද දිනයේ සිට අවුරුදු එකක කාලසීමාවක් සඳහා වලංගු විය යුතු ය ;
(ආ) වාමුවාවෙහි අලවනු ලබන ලේබලයේ පිටපත ඉදිරි වාමුවාවෙහි වම්පසින් ඇලවිය යුතු ය ; සහ
(ඇ) සේවයේ යෙදී සිටින විට රියදුරු හා කොන්දොස්තරවරයා විසින් අධිකාරිය විසින් අනුමත කරන ලද නිල ඇඳුමින් සැරසී සිටිය යුතු ය.

11. පහත සඳහන් ලේඛන සියලු අවස්ථාවල දී බස්රථය තුළ තිබිය යුතු ය -

(අ) බලපත්‍රය ;
(ආ) වාමුවාවෙහි අලවනු ලබන ලේබලය ;
(ඇ) බස්රථයේ යෝග්‍යතා සහතිකය ;
(ඈ) රියදුරුගේ වෛද්‍ය සහතිකය ;
(ඉ) අධිකාරිය විසින් අනුමත කරන ලද කාලසටහන ;
(ඊ) සිදුවීම් පිළිබඳ ලොග් සටහන් ;
(උ) ආදායම් බලපත්‍රය ;
(ඌ) රක්ෂණ සහතිකය ;
(එ) රියදුරු බලපත්‍රය ; සහ
(ඒ) ප්‍රථමාධාර පෙට්ටිය, අමතර රෝදයක් අතිරේක ඔසවනය (jack) , රෝදවල ඇණ මුරිච්චි ගැලවීමේ උපකරණය (wheel press) සහ ගිනි නිවීමේ උපකරණය.

12. බලපත්‍ර දරන්නා වෙත පහත සඳහන් වගකීම් තිබිය යුතු ය -

(අ) බලපත්‍ර දරන්නා විසින් කාලසටහනට අනුකූලව බස්රථය ප්‍රවාහන සේවයේ යෙදවිය යුතු අතර කිසිදු සාධාරණ හේතුවක් නොමැතිව සේවා වාර ගණන අඩු නොකළ යුතු ය;

(ආ) කිසිදු පිළිගත හැකි හේතුවක් නොමැතිව බලපත්‍ර දරන්නා විසින් බස්රථය මාස හයකට වැඩි කාලයක් සේවයේ යෙදවීම පැහැර හරිනු ලබන විට එම බලපත්‍රය අවලංගු කරන ලද බවට සලකනු ලැබිය යුතු ය;

(ඇ) අනතුරක් සිදු වූ අවස්ථාවක දී, සාධාරණ කාලසීමාවක් ඇතුළත එම අනතුර පිළිබඳව අධිකාරිය වෙත දැනුම් දීම බලපත්‍ර දරන්නාගේ කාර්යය විය යුතු ය;

(ඈ) යම් බස්රථයක් දින හතකට වඩා වැඩි කාලසීමාවක් සේවයේ යෙදවීම පැහැර හරිනු ලබන විට ඒ බව අධිකාරිය වෙත දැනුම් දීම සහ බලපත්‍රය, සිදුවීම් පිළිබඳ ලොග් සටහන් පොත සහ වාමුවාවෙහි අලවනු ලබන ලේබලය අධිකාරිය වෙත භාරදීම බලපත්‍ර දරන්නාගේ කාර්යය විය යුතු ය;

(ඉ) (i) බරපතල අනතුරක් සිදුවූ අවස්ථාවක දී, යම් අනුමත ආයතනයක් මගින් අලුත් යෝග්‍යතා සහතිකයක් ඉදිරිපත් කිරීමෙන් තොරව එම බස්රථය මගී ප්‍රවාහනයේ නිරත නොවිය යුතු ය.

(ii) (1) වන උපඡේදය යටතේ වන බස්රථයේ රියදුරු විසින් ප්‍රවාහන සේවයේ නිරත වීම සඳහා ඔහු සුදුසු වන බවට වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කරනු ලබන්නේ නම් මිස ප්‍රවාහන සේවයේ නියැලීම සඳහා ඔහුට අවසර ලබා නොදිය යුතු ය.

(ඊ) අධිකාරියේ අනුමතය ඇතිව හැර බස්රථය කුලියට ලබාදීම නොකළ යුතු ය;

(උ) බලපත්‍ර දරන්නා විසින් සෑම මසකම අවසාන දින හෝ එදිනට පෙර අධිකාරිය වෙත සේවා ගාස්තුවක් ගෙවිය යුතු ය;

(ඌ) බස්රථය පිරිසිදුව හා මාර්ගයේ ධාවනය කිරීමට සුදුසු තත්ත්වයෙන් පවතින බව හා කාර්මික වශයෙන් සේවය සඳහා යෝග්‍ය තත්ත්වයකින් පවතින බව බලපත්‍ර දරන්නා විසින් තහවුරු කළ යුතු ය;

(එ) බලපත්‍රය නිකුත් කරන ලද මාර්ග අංකය පැහැදිලිව බස්රථයේ ඉදිරිපස හා පසුපස යන දෙපැත්තේ ම ප්‍රදර්ශනය කළ යුතු ය;

(ඒ) පිටත්වන ස්ථානය සහ ළගාවන ස්ථානය දෙමළ, සිංහල හා ඉංග්‍රිසි භාෂාවලින් පැහැදිලිව ප්‍රදර්ශනය කළ යුතු ය;

(ඔ) "දුම්බීම තහනම්" යන වගන්තිය බස්රථයට ඇතුල්වන ස්ථානයේ හෝ එහි ඇතුළත ප්‍රදර්ශනය කළ යුතු ය;

(ඕ) බස්රථයේ දකුණු පස ඉදිරි ආසනය පූජ්‍ය පක්ෂය වෙනුවෙන් වෙන් කළ යුතු අතර, "පූජ්‍ය පක්ෂය සඳහා" යන වගන්තිය බස්රථයේ එම පැත්තේ ප්‍රදර්ශනය කළ යුතු ය;

(ක) බස්රථයේ වම්පස ඉදිරි ආසනය ආබාධිත තැනැත්තන් සඳහා වෙන් කළ යුතු අතර, "ආබාධිත තැනැත්තන් සඳහා" යන වගන්තිය බස්රථයේ එම පැත්තේ ප්‍රදර්ශනය කළ යුතු ය;

(ග) බස්රථයේ ඇතුල්වන ස්ථානයට ආසන්නව වම්පස ඉදිරි අසුන ගැබිණි මව්වරුන් සඳහා වෙන් කළ යුතු අතර, " ගැබිණි මව්වරුන් සඳහා" යන වගන්තිය බස්රථයේ එම පැත්තේ ප්‍රදර්ශනය කළ යුතු ය;

(ච) මගීන් වෙත අදාළ ගාස්තු ගෙවා ටිකට් පතක් මිලදී ගෙන එය ගමනාන්තය තෙක් තමා සන්තකයේ තබා ගත යුතු බවට නියම කරනු ලබන දැන්වීමක් බස්රථයේ ප්‍රදර්ශනය කළ යුතු ය;

(ජ) බලපත්‍ර අංකය බස්රථය ඇතුළත ප්‍රදර්ශනය කළ යුතු ය;

(ට) බස්රථය තුළ මනා ක්‍රියාකාරී තත්ත්වයෙන් පවතින ඔරලෝසුවක් තබා ගත යුතු ය;

(ඩ) යම් මගියකු විසින් යම් දුක්ගැනවිලි සම්බන්ධයෙන් පැමිණිලි කළ හැකි දුරකථන අංකයක් බස්රථය ඇතුළත ප්‍රදර්ශනය කළ යුතු ය.

මෙම නියෝගවල කාර්යය සඳහා බරපතල අනතුරක් යන්නට -

(අ) යම් මාරක අනතුරක්;

(ආ) රියදුරුගේ බරපතල නොසැලකිල්ල හේතුවෙන් සිදුවන යම් අනතුරක්; හෝ

(ඇ) තුවාල ලැබූ තැනැත්තකුට දින හතකට වැඩි කාලයක් සඳහා ප්‍රතිකාර ලබා ගැනීම පිණිස රෝහලකට ඇතුළත් කිරීමට සිදුවන යම් අනතුරක්.

ඇතුළත් විය යුතු ය.

13. යම් බස්රථයක රියදුරකු වෙත පහත සඳහන් වගකීම් තිබිය යුතු යඃ-

(අ) රියදුරු විසින් ඔහුගේ භාරයේ සිදුවීම් පිළිබඳ ලොග් සටහන් තබා ගත යුතු ය. ඔහු විසින් පිටත්වන වේලාව සහ ලගාවන වේලාව පිළිබඳ සටහන් ඇතුළත් කළ යුතු අතර එම සටහන් බස්රථ නැවතුම්පොළේ පාලකවරයා හෝ වේලා සටහන්කරු විසින් සහතික කළ යුතු ය;

(ආ) රියදුරු විසින් බස්රථය තුළ බලපත්‍රය හා වාමුවාවෙහි අලවනු ලබන ලේබලය තබා ගත යුතු ය;

(ඇ) රියදුරු විසින් මගීන්ගේ ආරක්ෂාව හා පහසුව තහවුරු කළ යුතු ය;

(ඈ) බස්රථයේ ප්‍රමාණවත් ඉඩකඩ පවතී නම් රියදුරු විසින් සෑම අනුමත බස් නැවතුමකම මගීන්ට එම බස්රථය තුළට ඇතුලු වීමට හා ඉන් බැස යාමට හැකිවන පරිදි බස්රථය නැවැත්විය යුතු ය;

(ඉ) රියදුරකු විසින් බස්රථය පැදවීමේ දී මත්පැන් හා මත්ද්‍රව්‍ය භාවිත නොකළ යුතු ය;

(ඊ) රියදුරකු විසින් අනුමත බස්නැවතුම්වල දී හැර වෙනත් යම් ස්ථානයක දී බස්රථය තුළට ගොඩවීමට හා ඉන් බැසීමට මගීන්ට අවසර ලබා නොදිය යුතු ය;

(උ) රියදුරු විසින් බස්රථය නොසැලකිලිමත් ලෙස හෝ අනතුරුදායක ආකාරයෙන් පැදවීම නොකළ යුතු ය;

(ඌ) රියදුරු විසින් කිසිදු මගියකුට බස්රථයේ පාපුවරුවේ ගමන් කිරීමට ඉඩ ලබා නොදිය යුතු ය;

(එ) බස්රථයක සෑම රියදුරකු විසින් අධිකාරියේ ලියාපදිංචි විය යුතු ය;

(ඒ) බස්රථය නියමිත වේලාවට පෙර බස්නැවතුම්පලට ඇතුළුවීම හෝ එහි නැවැත්වීම සිදු නොකළ යුතු අතර කාලසටහන දැඩිව අනුගමනය කිරීම සහ බස්රථ නැවතුම්පලේ සිටින පුද්ගලයන් හෝ ගොඩනැගිලිවලට යම් හානියක් සිදුවීම වැළැක්වීම පිණිස ප්‍රවේසම්සහගත ලෙස බස්රථය පැදවීම සිදු කළ යුතු ය;

(ඔ) බස්රථය අසාධාරණ වේගයකින් හෝ අනතුරුදායක ආකාරයකින් ගමන් නොකළ යුතු ය;

(ඕ) යම් රියදුරකු විසින් අමතර ලාභයක් ඉපැයීමේ හෝ අනෙකුත් බස්රථ ක්‍රියාකරුවන් වෙත අලාභයක් සිදු කිරීමේ කාර්යය සඳහා බස්රථය ප්‍රමාද නොකළ යුතු ය;

(ක) යම් රියදුරකු විසින් නිල ඇඳුමින් සිටින පරීක්ෂකවරුන් හෝ වෙනත් බලයලත් නිලධරයන් වෙත ඔහුගේ සහයෝගය ලබාදිය යුතු ය;

(ග) යම් රියදුරකු විසින් බස්රථය පදවන අතරතුර දී ජංගම දුරකථන භාවිත කිරීම හෝ ඔහුගේ අවධානය වෙනතකට යොමු කරනු ලබන වෙනත් යම් කාරණාවක් සිදු නොකළ යුතු ය;

(ච) යම් රියදුරකු විසින් ඔහුගේ නිල ඇඳුම සමඟ ඔහුගේ නම සඳහන් ලාංඡනයක් පැළඳිය යුතු ය;

(ජ) යම් රියදුරකු විසින් බස්රථයේ ස්පීකර් යන්ත්‍රය ඉහළ හඬකින් ක්‍රියාත්මක කිරීම සිදු නොකළ යුතු අතර ලිංගිකත්වයට නැඹුරු යම් ගීතයක් හෝ චිත්‍රපටියක් ප්‍රචාරය කිරීම හෝ විකාශනය කිරීම නොකළ යුතු ය.

14. බස්රථයක සෑම කොන්දොස්තරවරයකු වෙත පහත සඳහන් වගකීම් තිබිය යුතු ය -

(අ) කොන්දොස්තරවරයකු විසින් ඔහුගේ නිල ඇඳුම සමඟ ඔහුගේ නම සඳහන් ලාංඡනයක් පැළඳිය යුතු ය;

(ආ) කොන්දොස්තරවරයා විසින් ගමනාන්තය සඳහා අදාළ ගාස්තුව අය කරමින් ටිකට්පතක් ලබාදිය යුතු අතර, බස්රථයට ගමනාන්තය වෙත ලඟාවීමට නොහැකි වුවහොත් කොන්දොස්තරවරයා විසින් ගමනාන්තය තෙක් ඇති ඉතිරි දුර ගමන්කිරීම සඳහා වන ගාස්තුව ආපසු ලබාදිය යුතු අතර බස් ගාස්තු අධිකව අය නොකළ යුතු ය;

(ඇ) බස්රථයක වෙන්කර ඇති ආසනයක අසුන්ගෙන සිටින මගියකු විසින් එම ආසනය වෙන් කරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකු සඳහා ද එවැනි තැනැත්තකු බස්රථයකට ඇතුළු වූ අවස්ථාවක දී එම ආසනය එම තැනැත්තා වෙත ලබාදීම තහවුරු කිරීම පිණිස යම් කොන්දොස්තරවරයකු විසින් ක්‍රියා කළ යුතු ය;

(ඈ) යම් කොන්දොස්තරවරයකු විසින් සේවයේ යෙදී සිටින විට මත්පැන් හෝ මත්ද්‍රව්‍ය භාවිත නොකළ යුතු ය;

(ඉ) යම් කොන්දොස්තරවරයකු විසින් යම් මගියකුට බස්රථයේ පාපුවරුවේ ගමන් කිරීමට ඉඩ ලබා නොදිය යුතු ය;

(ඊ) යම් කොන්දොස්තරවරයකු විසින් යම් මගියකුට ඔහුගේ ගමන් මලු බස්රථයට ඇතුළුවන ස්ථානය අවහිර වන සේ තබා ගැනීමට ඉඩ ලබා නොදිය යුතු ය;

(උ) යම් කොන්දොස්තරවරයකු විසින් යම් මගියකුට බස්රථය තුළ දුම්පානය කිරීමට ඉඩ ලබා නොදිය යුතු ය;

(ඌ) යම් කොන්දොස්තරවරයකු විසින් මගීන් හට ගෞරවාන්විත අයුරින් සලකනු ලැබිය යුතු අතර තම කාර්යය විනීත ලෙස ඉටු කළ යුතු ය;

(එ) යම් බස්රථයක කොන්දොස්තරවරයකු අධිකාරියේ ලියාපදිංචි විය යුතු ය; සහ

(ඒ) යම් කොන්දොස්තරවරයකු විසින් බස්රථයේ ස්පීකර් යන්ත්‍රය ඉහළ හඬකින් ක්‍රියාත්මක කිරීම සිදු නොකළ යුතු අතර ලිංගිකත්වයට නැඹුරු යම් ගීත හෝ චිත්‍රපටි ප්‍රචාරය කිරීම හෝ විකාශනය කිරීම නොකළ යුතු ය.

15. තාවකාලික බලපත්‍රයක් නිකුත් කරන ලද යම් තැනැත්තකු හට මෙම නියෝග යටතේ බලපත්‍රයක් ලබා ගැනීම සඳහා මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් ගාස්තුව සමග ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකි ය.

## III වන කොටස

### *මගීන් වෙත පවතින්නා වූ වගකීම්*

16. සෑම මගියකු වෙත පහත සඳහන් වගකීම් තිබිය යුතු යඃ-

(අ) වෙන් කරන ලද ආසනයක අසුන්ගෙන සිටින මගියකු විසින් එසේ එම ආසනය වෙන්කර ඇති යම් තැනැත්තකු බස්රථයට ගොඩ වූ අවස්ථාවක දී ඔහු වෙත එම ආසනය ලබා දිය යුතු ය;

(ආ) යම් මගියකු විසින් බස්රථයට ගොඩ වූ වහාම බස් ගාස්තුව ගෙවා ටිකට්පත ලබා ගත යුතු ය;

(ඇ) යම් මගියකු විසින් ඔහුගේ ගමනේ අවසානය තෙක් ඔහුගේ භාරයේ ටිකට්පත තබාගත යුතු ය;

(ඈ) යම් මගියකු විසින් යම් කොන්දොස්තරවරයකු හෝ පරීක්ෂකවරයකු විසින් නියම කරනු ලබන විට දී ටිකට්පත ඉදිරිපත් කළ යුතු ය;

(ඉ) යම් මගියකු විසින් අනෙකුත් මගීන් සමග සහ කොන්දොස්තරවරයා සමග විනීත අයුරින් හැසිරිය යුතු ය;

(ඊ) යම් මගියකු විසින් යම් තහනම් කරන ලද භාණ්ඩ ගෙන යාම නොකළ යුතුය.

## IV වන කොටස

### *බස්රථ නැවතුම්පොළ*

17. කිසිදු තැනැත්තකු විසින් -

(අ) අධිකාරියේ අනුමතය මත හැර බස්රථ නැවතුම්පොළේ කිසිඳු දැන්වීමක්, පින්තූරයක් හෝ පත්‍රිකාවක් ප්‍රදර්ශනය නොකළ යුතු ය;

(ආ) බස්රථ නැවතුම්පොළේ කිසිදු අවසර නොලත් ව්‍යාපාරයක නිරත නොවිය යුතු ය;

(ඇ) බස්රථ නැවතුම්පොළේ සිටින යම් මගියකුට, බස්රථ ක්‍රියාකරුවකුට හෝ සේවා නියුක්තයකුට අවහිර කිරීම හා යම් බාධාවන් සිදු කිරීම නොකළ යුතු ය;

(ඈ) අධිකාරියේ අනුමතය මත හැර ශබ්ද විකාශන යන්ත්‍ර හෝ වෙනත් යම් උපකරණ භාවිත කිරීමෙන් බස්රථ නැවතුම්පොළේ ශබ්ද ඇති කිරීම නොකළ යුතු ය;

(ඉ) බස්රථයට මගීන් කැඳවා ගැනීම ඇතුළුව යම් කාර්යයක් සඳහා බස්රථ නැවතුම්පොළේ සිටින යම් තැනැත්තකුට අනදරයක් ඇතිවිය හැකි ආකාරයෙන් කෑගැසීම හා ශබ්ද ඇති කිරීම නොකළ යුතු ය.

## V වන කොටස

### *ඒකාබද්ධ කාලසටහන*

18. අධිකාරිය විසින් ඒකාබද්ධ කාලසටහනක් පිළියෙල කර එය කාර්යක්ෂම ලෙස හා ඵලදායී ලෙස ක්‍රියාත්මක කළ යුතු ය. ඒකාබද්ධ කාලසටහනක් පිළියෙල කිරීමේ දී පුද්ගලයන්ගේ අවශ්‍යතා සැලකිල්ලට ගනු ලැබිය යුතු අතර, මුළු බස්රථ වාර ගණනින් පුද්ගලික බස්රථ ක්‍රියාකරුවන් සඳහා ඉන් සියයට හැටක ප්‍රතිශතයක් සහ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සඳහා ඉන් සියයට හතලිහක ප්‍රතිශතයක් වශයෙන් බෙදා වෙන් කළ යුතු ය.

## VI වන කොටස

### *පොදු විධිවිධාන*

19. උතුරු පළාත තුළට ඇතුළු වන සෑම බස්රථයක්ම මෙම නියෝග එම බස්රථවලට අදාළ වනතාක් දුරට මෙම නියෝගවලට යටත් විය යුතු ය.

20. මෙම නියෝගවල විධිවිධාන උල්ලංඝනය කරනු ලබන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දසදහසක් නොඉක්මවනු ලබන දඩයකට හෝ වසර දෙකකට නොවැඩි කාලසීමාවක් සඳහා වන බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

*උපලේඛනය I*

(3 වන නියෝගය)

**"අ" ආකෘතිය**

**මගී සේවා බලපත්‍රය සඳහා වන ඉල්ලුම් පත්‍රයේ ආකෘතිය**

**(සාමාන්‍ය /අර්ධ සුඛෝපභෝගී/සුඛෝපභෝගී සේවය)**

**උතුරු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය**

| | |
|---|---|
| 01. බස්රථයේ ලියාපදිංචි හිමිකරු පිළිබඳ තොරතුරු: | බස්රථයේ අංකය<br>....................<br>(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි) |
| | කාර්යාලීය ප්‍රයෝජනය සඳහා |
| 1.1 සම්පූර්ණ නම : ..........................................................................<br>(දෙමළෙන්)<br>(සම්පූර්ණ නම) ..........................................................................<br>..........................................................................<br>(ඉංග්‍රීසියෙන්)<br>1.2 ලිපිනය : ..........................................................................<br>..........................................................................<br>1.2.1 දුරකථන අංකය : ..........................................................................<br>1.3 ජාතික හැඳුනුම්පත් අංකය : ..........................................................<br>1.3.1 සමාගම් ලියාපදිංචි අංකය : ..........................................................<br>1.4 පළාත : ..........................................................................<br>1.5 දිස්ත්‍රික්කය : ..........................................................................<br>1.5.1 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ..................................................<br>1.6 බස්රථයේ වටිනාකම ..........................................................................<br>1.6.1. ඉල්ලුම්කරු විසින් ණය මුදලක් ලබාගෙන ඇත්නම් කරුණාකර ඒ පිළිබඳ පහත විස්තර ඉදිරිපත් කරන්න<br>1.6.2 බැංකුවේ/මූල්‍ය සමාගමේ නම ..................................................<br>1.6.3 ලබාගෙන ඇති ණය මුදල - රු ..................................................<br>1.6.4 ණය මුදල ලබාගෙන ඇති දිනය : ..................................................<br>1.6.5 දැනට ගෙවීමට ඉතිරිව ඇති මුදල - රු ..........................................<br>1.6.6 ඉතිරිව ඇති වාරික ගණන .................................................. | |
| 1.7 ඉල්ලුම්කරු විසින් වෙනත් බස්රථ සඳහා බලපත්‍ර ලබාගෙන ඇත්නම් කරුණාකර ඒ පිළිබඳ විස්තර ඉදිරිපත් කරන්න. | කාර්යාලීය ප්‍රයෝජනය සඳහා |

| බස්රථයේ ලියාපදිංචි අංකය | මාර්ග අංකය | අධිකාරියේ නම | බලපත්‍රයේ අංකය | දිනය |
|---|---|---|---|---|
| | | | | |

2. බස්රථය පිළිබඳ තොරතුරු:

2.1 ලියාපදිංචි අංකය: ☐☐☐☐☐☐☐

2.2 (අ) නිෂ්පාදනය කරන ලද රට : ..........................................................

(ආ) වර්ගය : ............................... (ඇ) මාදිලිය : ................................

2.3 අවසර ලබා දී ඇති මගීන් සංඛ්‍යාව : ☐☐

2.4 දොරටු සංඛ්‍යාව : ☐☐

2.5 නිෂ්පාදන වර්ෂය : ☐☐☐☐

2.6 ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි කරන ලද පළමු වර්ෂය :

☐☐☐☐ ☐☐ ☐☐
වර්ෂය මාසය දිනය

2.7 ඇතුළත උස : (සෙ.මී.) ☐

2.8 බර : (කිලෝ ග්‍රෑම් ගණන) : .............................................................

2.9 ඔබ විසින් වෙනත් යම් අධිකාරියක් මගින් මෙම බස්රථය සඳහා මගී සේවා බලපත්‍රයක් ලබාගෙන තිබේ ද? (ඔව්/නැත) : .......................................

2.9.1 බස්රථය දැනට ධාවනයේ යෙදේ ද? (ඔව්/නැත) .................................

2.9.2 පිළිතුර ඔව් නම් කරුණාකර පහත තොරතුරු ඉදිරිපත් කරන්න :

| අධිකාරිය | මාර්ග අංකය | බලපත්‍ර අංකය | කල්ඉකුත් වන දිනය | අලුත් නොකිරීමට හේතු |
|---|---|---|---|---|
| | | | | |

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

2.10 මෙම බස්රථය යම් ආකාරයකින් අධිකරණයේ පවතින නඩුවකට සම්බන්ධයක් දරන්නේ ද?

(ඔව්/නැත) ....................

ඇත්නම්, ඒ පිළිබඳ විස්තර : ....................

2.11 බස්රථයේ යෝග්‍යතා සහතිකය සම්බන්ධයෙන් වන විස්තර :

2.11.1 අනුක්‍රමික අංකය : .................... □□.

2.11.2 දිනය : .................... (ව/මා/දි)

2.11.3 ගරාජයේ/වැඩපළේ ලියාපදිංචි අංකය : ....................

2.12 රක්ෂණය පිළිබඳ විස්තර : .................... □□

2.12.1 සමාගම/සංස්ථාව පිළිබඳ විස්තර : .................... □□□

2.12.2 රක්ෂණ වර්ගය : 1 ....................□.

2 ....................□

3 ....................

2.12.3 කල් ඉකුත්වන දිනය : .................... (ව/මා/දි)

2.13 ආදායම් බලපත්‍රයේ කල් ඉකුත්වන දිනය (ව/මා/දි) ....................

| 3. ක්‍රියාකරු විසින් කරගෙන යාමට අපේක්ෂා කරනු ලබන සේවාවන් පිළිබඳ විස්තර | කාර්යාලීය ප්‍රයෝජනය සඳහා |
|---|---|
| 3.1 මාර්ග අංකය □□□□□□□ | |
| 3.2 පිටත්වන ස්ථානය : .................... | |
| 3.2.1 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නම : .................... | □□□□□□□□□ |
| 3.3 ගමනාන්තය : .................... | |
| 3.3.1. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නම : .................... | □□□□□□□□□ |
| 3.4 සම්පූර්ණ ගාස්තුව : .................... | |
| (ගාස්තු පිළිබඳ උපලේඛනය අමුණා ඇත) | |
| 3.4.1 සම්පූර්ණ දුර (කිලෝ මීටර්) : .................... | |
| 3.5 ගමනාන්තය පිළිබඳ විස්තර/පිටත්වන ස්ථානය | |
| 3.5.1 මාර්ග අංකය : .................... □□□□□□□ | |
| 3.5.2 බස්රථ නැවතුම්පොළ : .................... | |
| 3.5.3 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නම : .................... | |
| 3.5.4 ගමනාන්තය : .................... | |
| 3.5.5 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නම : .................... | |
| 3.5.6 දුර (කිලෝ මීටර්) .................... | |
| 3.5.7 ගාස්තුව - රු : .................... | |

| 4. රියදුරු පිළිබඳ තොරතුරු | කාර්යාලීය ප්‍රයෝජනය සඳහා |
|---|---|
| 4.1 සම්පූර්ණ නම .................... (දෙමළෙන්) | |
| සම්පූර්ණ නම : .................... (ඉංග්‍රීසියෙන්) | |

4.2 උපන් දිනය : ..........................................................................................

4.3 ලිපිනය : ..................................................................................................

4.4 ජාතික හැඳුනුම්පත් අංකය : ....................................................................

4.5 රියදුරුගේ බලපත්‍ර අංකය : ......................................................................

4.5.1 ලබාගත් දිනය : ........................../......................./....................(ව/මා/දි)

4.5.2 කල් ඉකුත් වන දිනය : ......................./.................../................(ව/මා/දි)

4.6 වෛද්‍ය සහතිකය පිළිබඳ විස්තර :

4.6.1 සහතිකයේ අංකය : ..................................................................................

4.6.2 නිකුත් කරන ලද දිනය : .................../..................../.................(ව/මා/දි)

4.6.3 කල් ඉකුත් වන දිනය : ...................../..................../.................(ව/මා/දි)

4.7 උතුරු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් පවත්වනු ලබන මගී සේවා රියදුරු බලපත්‍රය සඳහා පවත්වනු ලබන පුහුණු පාඨමාලාව රියදුරු විසින් සම්පූර්ණ කර තිබේ ද?

ඔව්/නැත : ..............................................................................................

4.7.1 මගී සේවා රියදුරු බලපත්‍රයේ අංකය :

4.8 හදිසි අනතුරුවලට භාජනය වී තිබේ ද?

4.8.1 පසුගිය වර්ෂ තුන තුළ අනතුරු සංඛ්‍යාව

| මාරක | භයානක | නම |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |

4.8.2 විභාග වෙමින් පවතින නඩු කටයුතු තිබේ ද ?

ඔව්/නැත : ...........................................................................................

පිළිතුර ඔව් නම් විස්තර ඉදිරිපත් කරන්න.

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

| | | | |
|---|---|---|---|
| අනතුර සිදු වූ දිනය | | | |
| වර්ගය | | | |
| තුවාල ලැබූ තැනැත්තන් සංඛ්‍යාව | | | |
| මියගිය තැනැත්තන් සංඛ්‍යාව | | | |
| දේපළ අහිමි වීම (දළ වශයෙන්) | | | |

4.8.3. අනතුරෙන් පසු :

(අ) රියදුරු වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කර තිබේ ද?
(ඔව්/නැත) : ..................................................................................

(ආ) රියදුරු නැවත පුහුණු කිරීමේ පාඨමාලාවක් සම්පූර්ණ කර තිබේ ද?
(ඔව්/නැත) : ..................................................................................

(ඇ) රියදුරු බලපත්‍රය අත්හිටුවා/අවලංගු කර තිබේ ද?
(ඔව්/නැත) : ..................................................................................

5. කොන්දොස්තරවරයා පිළිබඳ විස්තර

5.1 සම්පූර්ණ නම : ..........................................................................................

(දෙමළෙන්)

සම්පූර්ණ නම : ..........................................................................................

(ඉංග්‍රීසියෙන්)

5.2 උපන් දිනය : ..........................................................................................

5.3 ලිපිනය : ..........................................................................................

5.4 ජාතික හැඳුනුම්පත් අංකය : ..........................................................................

5.5 මගී සේවා සඳහා වන කොන්දොස්තරවරයාගේ බලපත්‍ර අංකය :

..........................................................................................

5.6 කොන්දොස්තරවරයා විසින් උතුරු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් පවත්වනු ලබන මගී සේවා කොන්දොස්තරවරුන්ගේ බලපත්‍රය සඳහා වන පුහුණු පාඨමාලාව සම්පූර්ණ කර තිබේ ද?

ඔව්/නැත : ..........................................................................................

5.7 මගී සේවා රක්ෂණ ඔප්පුවේ අංකය : ......................................................

මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් සපයා ඇති සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි වන බවට මා මෙයින් තහවුරු කරමි. තව ද මා විසින් මෙම බලපත්‍රයට අදාළ ගිවිසුම්, රීති සහ නියෝග, කොන්දේසි, නියම සහ උපදෙස් උල්ලංඝනය කරනු ලැබුවහොත් මා වෙත නිකුත් කරන ලද එකී බලපත්‍රය අත්හිටුවීමට හෝ අවලංගු කිරීමට යටත් වන බව මා දැන සිටිමි. තව ද රීති හා නියෝග යටතේ දඬුවම් ලැබීමට ද මා යටත් වන බව දැන සිටිමි.

ජාතික ප්‍රවාහන කොමිෂන් සභාවේ අධිකාරීන් විසින් කලින් කල හඳුන්වා දෙනු ලබන කාල සටහනට සහ අයකරනු ලැබිය යුතු ගාස්තු සම්බන්ධයෙන් වන උපදෙස්වලට අනුකූලව බස්රථ සේවාව පවත්වාගෙන යනු ලබන බවට මා මෙයින් තහවුරු කරනු ලබන අතර එකඟ වූ ගාස්තු පිළිබඳ උපලේඛනවලට අනුව ගාස්තු අයකරනු ලැබීමට මෙයින් එකඟ වෙමි.

......................................................

ඉල්ලුම්කරුගේ අත්සන

දිනය : .............................................

"ආ" ආකෘතිය

(7 වන නියෝගය)
උ.ප.මා.ම.ප්‍ර.අ.

**මගී සේවාව සඳහා මාර්ග බලපත්‍රය අලුත්කරවා ගැනීම සඳහා වන ඉල්ලුම් පත්‍රයේ ආකෘතිය**

❖ බස් රථයේ අංකය : | | | | | | | | | | උ.ප මගී සේවා බලපත්‍රයේ අංකය:.උ.ප.මා.ම.ප්‍ර.අ /……

1. හිමිකරුගේ නම : ..........................................................................................................................................
2. වලංගු රක්ෂණ අංකය : .................................................................................. කල්ඉකුත් වන දිනය : ..........................
3. වලංගු වාහන යෝග්‍යතා සහතිකයේ අංකය : .................................................. කල්ඉකුත් වන දිනය : ..........................
4. වලංගු වාහන ආදායම් බලපත්‍ර අංකය : .............................................................. කල්ඉකුත් වන දිනය : ........................
5. රියදුරුගේ වෛද්‍ය සහතිකයේ අංකය : ................................................................ කල්ඉකුත් වන දිනය : ......................

දිනය : .......................................... ....................................................
හිමිකරුගේ අත්සන

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි**

ඉහත විස්තර මුල් පිටපත් සමඟ සසඳා බලා මෙයින් ඉදිරිපත් කරමි.

දිනය : .......................................... ....................................................
විෂය භාර නිලධාරී

ඉහත සියලු විස්තර නිවැරදි වන බවට මා මෙයින් තහවුරු කරමි.

දිනය : ........................................... ....................................................
ප්‍රධාන නිලධරයා

මගී සේවා බලපත්‍රය අලුත් කරවා ගැනීම සඳහා අවසරය ප්‍රදානය කරමි./ ප්‍රතික්ෂේප කරමි.

දිනය : ............................................. .....................................................
දිස්ත්‍රික් කළමනාකරු

'ඇ' ආකෘතිය

(8 වන නියෝගය)

උ.ප.මා.ම.ප්‍ර.අ.

**බස් රථය වෙනස් කරවා ගැනීම සඳහා වන ඉල්ලුම් පත්‍රය**

1. හිමිකරුගේ නම : ...............................................
2. වෙනස් කළ යුතු පරණ බස් රථයේ ලියාපදිංචි අංකය : ...............................................
3. මාර්ග බලපත්‍ර අංකය : උ.ප.මා.ම.ප්‍ර.අ. / : ...............................................
4. ධාවනය කරනු ලබන මාර්ග අංකය : ...............................................
5. වෙනස් කිරීම සඳහා හේතුව : ...............................................
6. ඒ වෙනුවට යොදවන අලුත් බස් රථයේ විස්තර :-
   - 6.1 ලියාපදිංචි අංකය : ...............................................
   - 6.2. නිෂ්පාදනය කරන ලද රට : ...............................................
   - 6.3. වර්ගය : ...............................................
   - 6.4. මාදිලිය :: ...............................................
   - 6.5. ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද වර්ෂය : ...............................................
   - 6.6. උස : ...............................................
   - 6.7. ආසන සංඛ්‍යාව : ...............................................
   - 6.8. දොරටු සංඛ්‍යාව : ...............................................
   - 6.9. වාහනයේ මිල : ...............................................
   - 6.10. මූල්‍ය ආධාර ප්‍රදානය කරන ලද බැංකුව/ආයතනය : ...............................................
   - 6.11. ලබාගත් මුදල : ............................................... ...............................................
   - 6.12 වාරික මුදල : ...............................................
   - 6.13. ගෙවීමට ඇති මුළු මුදල : ...............................................
7. වලංගු රක්ෂණ අංකය. : ............................................... කල් ඉකුත් වන දිනය : ...............................
8. වාහනයේ වලංගු යෝග්‍යතා සහතිකයේ අංකය : ......................... කල් ඉකුත් වන දිනය : ...............................
9. වාහනයේ වලංගු බලපත්‍ර අංකය : ............................................... කල් ඉකුත් වන දිනය : ...............................
10. රියදුරුගේ වෛද්‍ය සහතිකයේ අංකය. : ...................................... කල් ඉකුත් වන දිනය : ...............................

මෙහි 2 හි සඳහන් බස් රථය වෙනුවට මෙහි 6.1 හි සඳහන් බස් රථය යෙදවීමට මා මෙයින් ඉල්ලා සිටිමි.

දිනය : .........................................

.......................................
හිමිකරුගේ අත්සන

---

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි**

ඉහත විස්තර මුල් පිටපත් සමඟ සසඳා බලා මෙයින් ඉදිරිපත් කරමි.

දිනය : ..................................

.......................................
විෂය භාර නිලධාරී

ඉහත සියලු විස්තර නිවැරදි බවට මා මෙයින් තහවුරු කරමි.

දිනය : ...................................

.......................................
ප්‍රධාන නිලධාරී

බස් රථය වෙනස් කිරීමට මෙයින් අවසරය ලබාදෙනු ලැබේ./ ප්‍රතික්ෂේප කරනු ලැබේ.

දිනය : ..................................

.......................................
දිස්ත්‍රික් කළමනාකරු

*"ඇ" ආකෘතිය*

(9 වන නියෝගය)

උ.ප.මා.ම.ප්‍ර.අ.

**මාර්ග බලපත්‍රයේ නිවැරිදි කිරීමක් කරවා ගැනීම සඳහා වන ඉල්ලුම්පත්‍රයේ ආකෘතිය**

1. හිමිකරුගේ නම : ..........................................................................................................................................
2. මාර්ග බලපත්‍ර අංකය : උ.ප.මා.ම.ප්‍ර.අ. /: ...........................................................................................................
3. වෙනස් කිරීමට හේතුව : ..........................................................................................................................
4. වෙනස් කරනු ලබන ආකාරය : .................................................................................................................

දිනය : ............................... ......................................

හිමිකරුගේ නම

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි**

ඉහත විස්තර මුල් පිටපත් සමඟ සසඳා බලා මෙයින් ඉදිරිපත් කරනු ලැබේ.

දිනය : ............................... ......................................

විෂය භාර නිලධාරී

ඉහත සියලු විස්තර නිවැරදි බවට මා මෙයින් තහවුරු කරමි.

දිනය : ............................... ......................................

ප්‍රධාන නිලධාරී

වෙනස් කිරීම සඳහා අවසරය මෙයින් ප්‍රදානය කරනු ලැබේ./ප්‍රතික්ෂේප කරනු ලැබේ.

දිනය : ............................... ......................................

දිස්ත්‍රික් කළමනාකරු

*II වන උපලේඛනය*

(3 වන නියෝගය)

**අධිකාරිය විසින් තීරණය කරනු ලබන ගාස්තු**

මෙම උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති යම් ක්‍රියාකාරකමක් සඳහා ගෙවිය යුතු ගාස්තු මෙම උපලේඛනයේ II වන තීරයේ අනුරූපී සටහනේ පෙන්නුම් කර ඇති මුදල් ප්‍රමාණයන් විය යුතු ය.

| I වන තීරය | II වන තීරය |
|---|---|
| ගෙවිය යුතු ගාස්තු | රු. ශත |
| 1. බලපත්‍රයක් සඳහා ඉල්ලුම්පත්‍ර ගාස්තුව | 1,000.00 |
| 2. තාවකාලික බලපත්‍රයක් වෙනුවට ස්ථිර බලපත්‍රයක් නිකුත් කිරීම : | |
| i. කිලෝ මීටර් 1 සිට 25 දක්වා | 50,000.00 |
| ii. කිලෝ මීටර් 26 සිට 50 දක්වා | 75,000.00 |
| iii. කිලෝ මීටර් 51 සිට 75 දක්වා | 100,000.00 |
| iv. කිලෝ මීටර් 76 සිට 100 දක්වා | 125,000.00 |
| v. කිලෝ මීටර් 101 ට වැඩි | 150,000.00 |

| I වන තීරය<br>ගෙවිය යුතු ගාස්තු | II වන තීරය<br>රු. ශත |
|---|---|
| 3. අධිකාරියේ ටෙන්ඩර් පටිපාටියට යටත්ව - අලුත් බලපත්‍රයක් නිකුත් කිරීම | |
| 4. මගී සේවා බලපත්‍රයක් සඳහා අලුත් කිරීමේ ගාස්තුව | |
| i. අලුත් කිරීමේ ගාස්තුව (නියමිත දිනය තුළ) | 10,000.00 |
| ii. අලුත් කිරීමේ ගාස්තුව (කල් ඉකුත්වන දිනයේ සිට දින 7 ක් දක්වා) | 13,000.00 |
| iii. අලුත් කිරීමේ ගාස්තුව (කල් ඉකුත්වන දිනයේ සිට දින 7 කට පසු සහ එක් මාසයක් තුළ) | 15,000.00 |
| iv. අලුත් කිරීමේ ගාස්තුව (කල් ඉකුත්වන දිනයේ සිට එක් මාසයකට පසු සහ මාස දෙකක් ඇතුළත) | 20,000.00 |
| v. අලුත් කිරීමේ ගාස්තුව (කල් ඉකුත්වන දිනයේ සිට මාස දෙකකට පසු සහ මාස තුනක් ඇතුළත) | 25,000.00 |
| vi. අලුත් කිරීමේ ගාස්තුව (කල් ඉකුත්වන දිනයේ සිට මාස තුනකට පසු සහ මාස හයක් දක්වා) මාසයකට රුපියල් 5,000/- ක් වශයෙන් | |
| 5. මගී සේවා බලපත්‍රයක පිටපතක් ලබා ගැනීම (හානියට පත්ව ඇත්නම්) | 2,500.00 |
| 6. මගී සේවා බලපත්‍රයක පිටපතක් ලබා ගැනීම (නැති වී/අස්ථානගත වී ඇති විට) | 5,000.00 |
| 7. වාමුවාවෙහි අලවනු ලබන මගී සේවා ලේබලයේ පිටපතක් ලබා ගැනීම (හානියට පත්ව ඇත්නම්) | 2,000.00 |
| 8. වාමුවාවෙහි අලවනු ලබන මගී සේවා ලේබලයේ පිටපතක් ලබා ගැනීම් (නැති වී/අස්ථානගත වී ඇත්නම්) | 2,500.00 |
| 9. විශේෂ කුලී බලපත්‍රය - දිනකට | 200.00 |
| 10. තාවකාලික බලපත්‍රය - දිනකට | 200.00 |
| 11. මාර්ග බලපත්‍රය පැවරීම | 150,000.00 |
| 12. බලපත්‍රයක් සන්තකයේ තිබෙන තැනැත්තකු එය තමාගේ නිත්‍යානුකූල උරුමකරු වෙත (බිරිඳ හෝ ස්වාමි පුරුෂයා හෝ දරුවන්) වෙත පැවරීමෙන් පසුව මියගොස් ඇති විට | නැත |
| 13. පවුලේ සාමාජිකයන් අතර බලපත්‍රය පැවරීම (බිරිඳ හෝ ස්වාමි පුරුෂයා හෝ දරුවන්) | 50,000.00 |
| 14. බස් රථය තුළ කාල සටහනේ පිටපතක් බෙදා හැරීම | 100.00 |
| 15. බස්රථයක් සඳහා (අධිකාරිය එකඟ වන්නා වූ විට) එහි හිමිකරුවන්ගේ පොදු ඉල්ලීම මත කාලසටහන සංශෝධනය කිරීම සඳහා | 250.00 |
| 16. ගාස්තු පිළිබඳ අමතර උපලේඛනයක් බෙදා හැරීම | 50.00 |
| 17. බස්රථය වෙනස් කිරීම සඳහා ගාස්තු | 10,000.00 |
| 18. මාර්ගය වෙනස් කිරීම සඳහා ගාස්තු | 25,000.00 |
| 19. මාසික ධාවන සටහන නිකුත් කිරීම (පළාත තුළ) | 1,000.00 |
| 20. ගාස්තු පිළිබඳ සටහන් උපලේඛනයක් නිකුත් කිරීම (පළාත් අතර) | 1,500.00 |
| 21. මාසික ධාවන සටහන ලබාගැනීම ප්‍රමාද කිරීම (මාසිකව 30% ක අතිරික්තයක් ගෙවිය යුතුය) | |
| 22. අධිකාරිය විසින් බස් රථය පරීක්ෂා කිරීම | 2,000.00 |
| 23. බලපත්‍රය වෙනස් කිරීම | 1,000.00 |
| 24. රියදුරු සහ කොන්දොස්තරවරයා විසින් බලපත්‍රය ලබා ගැනීම | 2,500.00 |

*III වන උපලේඛනය*

(6 වන නියෝගය)

**මගී සේවා බලපත්‍රය**

**උතුරු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය**

**I වන කොටස**

බලපත්‍ර අංකය : උ.ප.මා.ම.ප්‍ර.අ./……………

1. බස්රථයේ ලියාපදිංචි අංකය : ..........................................................................................
2. හිමිකරුගේ/ක්‍රියාකරුගේ නම : ..........................................................................................
   - 2.1 ලිපිනය : ..........................................................................................
   - 2.2 ජාතික හැඳුනුම්පත් අංකය/සමාගමක් නම් එහි නම : ..........................................................................................
3. අවසර ලබා දී ඇති සේවය :
   - 3.1 මාර්ග අංකය : ..........................................................................................
     - සිට : ..........................................................................................
     - දක්වා : ..........................................................................................
     - හරහා : ..........................................................................................
   - 3.2 ගමන සඳහා සම්පූර්ණ ගාස්තුව : ..........................................................................................
   - 3.3 අවසර ලබා දී ඇති ආසන සංඛ්‍යාව : ..........................................................................................
4. බලපත්‍රයේ වලංගු කාලසීමාව :
   - සිට : ..........................................................................................
   - දක්වා : ..........................................................................................

2016 අංක 1 දරන උතුරු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය ප්‍රඥප්තිය මගින් පැවරී ඇති බලතල ප්‍රකාර ඉහත සඳහන් ලියාපදිංචි හිමිකරු/ක්‍රියාත්මක කරනු ලබන සමාගම වෙත මෙම බලපත්‍රයේ II වන කොටසේ ලබා දී ඇති කොන්දේසිවලට යටත්ව මගීන් ප්‍රවාහනය කිරීම සඳහා අවසර ලබාදෙනු ලැබේ. බස්රථය මෙම බලපත්‍රය නිකුත් කරන ලද මාර්ගය හැර වෙනත් යම් මාර්ගයක යම් සේවාවක් ලබාදීම සඳහා යෙදවීම නොකළ යුතු ය.

දිනය : ........................ සභාපති

උතුරු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය

මෙම බලපත්‍රයේ හිමිකරු හෝ සමාගමේ නියෝජිත ..................................... වන මා විසින් බලපත්‍රයේ I වන කොටසේ හා II වන කොටසේ සඳහන් කොන්දේසිවලට යටත්ව ක්‍රියා කරනු ලබන බව, මෙම බලපත්‍රය පැවරිය නොහැකි බව සහ කොන්දේසි කඩවන ආකාරයෙන් මා විසින් ක්‍රියා කරනු ලැබුවහොත් මෙම බලපත්‍රය අවලංගු කරනු ලබන බවට සම්පූර්ණයෙන් දැන සිටින බව මෙයින් තහවුරු කරමි.

දිනය : ................................. ..................................

අත්සන

**දීර්ඝ කිරීම**

මගී සේවා බලපත්‍ර අංකය : ..........
බලපත්‍රයේ වලංගු කාලසීමාව :- සිට : .......... දක්වා : ..........
ලදුපත් අංකය : .......... දිනය : ..........
ලේබල අංකය : ..........
ගමන සඳහා සම්පූර්ණ ගාස්තුව : ..........

දිනය : .......... ..........
සාමාන්‍යාධිකාරී

**බස්රථය වෙනස් කිරීම**

බස්රථයේ ලියාපදිංචි අංකය : ..........
බලපත්‍රයේ වලංගු කාලසීමාව :- සිට : .......... දක්වා : ..........
ලදුපත් අංකය : .......... දිනය : ..........
ලේබල අංකය : ..........
ගමන සඳහා සම්පූර්ණ ගාස්තුව : ..........

දිනය : .......... ..........
සාමාන්‍යාධිකාරී

**හිමිකරු පිළිබඳ විස්තර**

හිමිකරුගේ/ක්‍රියාකරුගේ නම : ..........
ලිපිනය : ..........
ජාතික හැඳුනුම්පත් අංකය : ..........
බලපත්‍රයේ වලංගු කාලසීමාව :- සිට : .......... දක්වා : ..........
ලදුපත් අංකය : .......... දිනය : ..........
ලේබල අංකය : ..........
ගමන සඳහා සම්පූර්ණ ගාස්තුව : ..........

දිනය : .......... ..........
සාමාන්‍යාධිකාරී

**මාර්ගය වෙනස් කිරීම**

මාර්ග අංකය : ..........
සිට : .......... දක්වා : .......... හරහා : ..........
බස්රථයේ ලියාපදිංචි අංකය : ..........
බලපත්‍රයේ වලංගු කාලසීමාව :- සිට : .......... දක්වා : ..........
ලදුපත් අංකය : .......... දිනය : ..........
ලේබල අංකය : ..........
ගමන සඳහා සම්පූර්ණ ගාස්තුව : ..........

දිනය : .......... ..........
සාමාන්‍යාධිකාරී

**රියදුරු පිළිබඳ විස්තර**

නම : ..........................................................................................................................

වෛද්‍ය සහතිකයේ අංකය : ..........................................................................................................................

වෛද්‍ය සහතිකයේ කල් ඉකුත් වන දිනය : ..........................................................................................................................

ප්‍රවාහන අධිකාරියේ හැඳුනුම්පත් අංකය : ..........................................................................................................................

**කොන්දොස්තරවරයා පිළිබඳ විස්තර**

නම : ..........................................................................................................................

ජාතික හැඳුනුම්පත් අංකය : ..........................................................................................................................

ප්‍රවාහන අධිකාරියේ හැඳුනුම්පත් අංකය : ..........................................................................................................................

**අවසර ලබා දී ඇති**

**බස්රථ නැවතුම්පොළවල්**

**කාලසටහන් සහ වෙනත් කරුණු වැනි විස්තර**

IV වන උපලේඛනය

(6 වන නියෝගය)

**උතුරු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය**

වාමුවාවෙහි අලවනු ලබන ලේබලය

බලපත්‍ර අංකය : උ.ප.මා.ම.ප්‍ර.අ./ බස්රථයේ ලියාපදිංචි අංකය සේවා වර්ගය :

මාර්ග අංකය : දක්වා :

වලංගු කාලසීමාව : සිට :

හරහා : දිනය

..........................................

සාමාන්‍යාධිකාරි

06 - 30